# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2372/06 - 2024 පෙබරවාරි මස 19 වැනි සඳුදා - 2024.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *(I) වන තීරය* | | | | *(II) වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 1. | 07.13 | | උඳු : | |
| | | 0713.31.22 | පිට කුරුට්ට ඉවත්කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 0713.31.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 300.00 |



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| *(I) වන තීරය* | | | | *(II) වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං.ව. ශීර්ෂය* | *සං.ව. සංකේතාංකය* | *විස්තරය* | |
| 2. | | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 300.00 |
| 3. | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයට රු. 300.00 |
| 4. | 10.05 | 1005.90 | බඩ ඉරිඟු | කි. ග්‍රෑමයට රු. 25.00 |
| 5. | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 1008.21.90 | බීජ - අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකානා විශේෂ) | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 300.00 |

2. ඉහත සඳහන් කර ඇති බඩ ඉරිඟු, උඳු, මුං ඇට, කව්පි හා කුරක්කන් ආනයනය කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය මත සිදුකළ යුතුය.

3. කව්පි (සං. ව. සංකේතාංක 0713.35.90) සහ කුරක්කන්/අනෙකුත් - මිලට් (සං. ව. සංකේතාංක, 1008.21.10, 1008.21.90, 1008.29.10, 1008.29.90) ආනයනය කිරීමට අදාළව 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ 2023 මාර්තු 04 දිනැති අංක 2321/76 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය 2024 පෙබරවාරි 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

4. මෙම නියමය, 2024 පෙබරවාරි මස 20 වැනි දිනෙන් ආරම්භ වී 2024 දෙසැම්බර 31 වැනි දින දක්වා 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

EOG 02 - 0147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.